77 වන ඉන්දීය නිදහස් දිනය නිමිත්තෙන් ඉන්දියානු මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමාගේ පණිවිඩය

ආයුබෝවන්, වණක්කම්, නමස්කාර්!

ඉන්දියාවේ 77 වන නිදහස් දිනය නිමිත්තෙන් ශ්‍රී ලංකාවේ සිටින සියලු ඉන්දියානුවන්ටත් මාගේ ශ්‍රී ලාංකික සහෝදර සහෝදරියන්ටත් උණුසුම් සුභාශිංසන පිරිනමමි.

අසාදි කා අම්රිත් මහෝත්සවය කූටප්‍රාප්තියට ළඟා වන මෙම වසරේදී, ඉන්දියාව අම්රිත් කාල් - සැමට සෞභාග්‍යය ගෙන දෙන තාක්ෂණයෙන් බල ගැන්වූ සහ දැනුම මත පදනම් වූ ආර්ථිකයක් සමඟින් ඉදිරි වසර 25ක පරිවර්තනීය වර්ධනයක කතාන්දරය යථාර්ථවත් කිරීමට සූදානමින් සිටියි.

අසල්වැසියා ප්‍රථමයෙන් සහ සාගර් (කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය) යන අපගේ ප්‍රතිපත්තීන් සැමට සෞභාග්‍යය උදා කර දීමට ඉන්දියාවේ කැපවීම පිළිඹිබු කරන අතර අපි තවදුරටත් ශ්‍රී ලාංකික ජනතාවට අවශ්‍ය මොහොතේදී ඔවුන් හා රැඳී සිටිමු.

දැන් ශ්‍රී ලංකාව නැවතත් යථා තත්වයට පත්වීමට සූදානමින් සිටින අවස්ථාවක ඉන්දියා - ශ්‍රී ලංකා මිත්‍රත්වය ද නව සන්ධිස්ථානයන් කරා ගමන් කරමින් සිටියි. අපි මෙම වසරේ දී රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල 75 වන වසර සම්පූර්ණ කරන අතර වඩා සමීප ආර්ථික හවුල්කාරිත්වයක් ඇති කර ගැනීම සඳහා ඉදිරි වසර 25 සඳහා සැලසුම් සකස් කරමින් සිටිමු.

**'සම්බන්ධකතාවය ප්‍රවර්ධනය කරමින්, සෞභාග්‍යය උත්ප්‍රේරණය කරමින්'** අප නායකයන් විසින් ප්‍රකාශයට පත් කරන ලද දැක්ම සියලු පැතිකඩ ඔස්සේ සම්බන්ධකතාවය ඉහළ නැංවීම කේන්ද්‍ර කරගත් දිගු කාලීන මාර්ග සිතියමකි.

2023 ජූලි මාසයේ දී අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් සිදු කරන ලද ඉන්දීය සංචාරය අතරතුරදී දරෙට ජනතාව වඩා සමීප කරවන බලශක්තිය, කිරි නිෂ්පාදන, වඩා ඉහළ ගුවන් සහ සමුද්‍රීය සම්බන්ධකතාවය, UPI සබඳතාවය සහ තවත් ක්ෂේත්‍ර රැසක් සම්බන්ධයනේ සිදු කරන ලද විවිධ නිවේදන සහ ලද ප්‍රතිඵල මමෙ දැක්මට සුවිශේෂී ජවයක් ලබා දී ඇත.

මිත්‍රවරුනි, අනාගතය තාක්ෂණ කේන්ද්‍රීය වනු ඇත. ශ්‍රී ලංකාව ඩිජිඉකෝන් 2030 ගමන අරඹා ඇති මමෙ අවස්ථාවේදී අප අපගේ ඩිජිටල් පොදු යටිතල පහසුකම්වලින් සවිබල ගන්වන ලද අන්තර්ග්‍රහණීය වර්ධනය පිළිබඳ ඉන්දියාවේ අත්දැකීම් බදො හදා ගැනීමට සම්පව කටයුතු කරමින් සිටිමු.

මමෙ වසර ඉන්දීය සම්භවයක් ඇති ද්‍රවිඩ ජනතාව ශ්‍රී ලංකාවට පැමිණ වසර 200ක් සම්පූර්ණ වීම නිසා ද සුවිශේෂී වසරක් වේ. ඉන්දීය රජය මමෙ ප්‍රජාවගේ සමස්ත සුබසිද්ධිය උදසො ශ්‍රී ලංකා රුපියල් බිලියන 3ක විස්තීර්ණ ප්‍රදාන පැකේජයක් ප්‍රකාශයට පත් කර ඇත. එවන් පැකේජයක් නැගනෙහිර පළාතේ ජනතාව සඳහා ද ලබා දී ඇත.

ශිෂ්ටාචාරමය බැඳීම, බදො හදා ගත්තා උරුමය සහ අප දරෙට ජනතාව අතර පවතින දිගු කාලීන බැඳීම් යන පදනම් මත තවදුරටත් සවිමත්ව ගොඩනැගෙමින් අපි ජනතාවගේ සෞභාග්‍යය සහ ප්‍රගතිය සඳහා වන ඒකාබද්ධ දැක්මක් සමඟින් ඉන්දියා - ශ්‍රී ලංකා බැඳීම් හි මීළඟ අදියරට පිවිසමු. එළඹනෙ අම්රිත් කාල් තුළ ඉන්දියා - ශ්‍රී ලංකා හවුල්කාරීත්වය වඩාත් ගැඹුරු සහ පුළුල් ලසෙ වර්ධනය වීමට සියල්ල සූදානම් බව මට විශ්වාසයි.

***